# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/8 – 2020 සැප්තැම්බර් 22 වැනි අඟහරුවාදා – 2020.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/199.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ මයා ඇතුළු සේවකයන් දසදෙනා, අංක 33 /ඩී, තොරණගොඩ, ඇහැලියගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල (The Ceylon Railway Uniform Staff Benevolent Fund), දුම්රිය මූලස්ථානය, කොළඹ 10, 2. සභාපති, (The President) ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, දුම්රිය මූලස්ථානය, කොළඹ 10, 3. ලේකම් හා භාණ්ඩාගාරික, (The Secretary Treasurer) ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, දුම්රිය මූලස්ථානය, කොළඹ 10.


1A – G 32934 – 35(2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/F වී. ජයරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/199.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ මයා ඇතුළු සේවකයන් දසදෙනා, අංක 33 /ඩී, තොරණගොඩ, ඇහැලියගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල (The Ceylon Railway Uniform Staff Benevolent Fund), දුම්රිය මූලස්ථානය, කොළඹ 10, 2. සභාපති, (The President) ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, දුම්රිය මූලස්ථානය, කොළඹ 10, 3. ලේකම් සහ භාණ්ඩාගාරික, (The Secretary Treasurer) ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල, දුම්රිය මූලස්ථානය, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා දුම්රිය නිළ ඇඳුම් සේවා අර්ථසාධක අරමුදලේ ඩබ්ලිව්. ඒ. එස්. වෙත්තසිංහ මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් දස දෙනාහට,

1. පත්වීම් සේවා කොන්දේසිවල පරිදි ලබානොගත් ඉතිරි විවේක නිවාඩු දින සඳහා ගෙවීම් නොකිරීම.
2. වාර්ෂික දුම්රිය බලපත්‍ර කට්ටල 03ක් ලබාදීම අත්හිටුවීම සහ
3. බඳවා ගැනීමේ සේවා කොන්දේසි ප්‍රකාරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පූර්වාදර්ශ කොට ගනිමින් 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වැටුප් සංශෝධන සිදුකර ඇතත් 2016 වසරේ සිට 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයෙන් පසු වැටුප් සංශෝධනය නොකිරීම.

   මගින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද ? යන්න පිළිබඳව වේ.''

1. ඩබ්. ඒ. එස්. වෙත්තසිංහ
2. ආර්. ඒ. කේ. ජේ. රණතුංග
3. ඩී. එන්. විජේසූරිය

6.එම්. මහින්දසිරි
7. එම්. ඩී. පී. එස්. ගුණතිලක
8. කේ. පී. චන්ද්‍රජිත්

4. උදාර එස්. ලියන්වල
5. ටී. එම්. එන්. එච්. බණ්ඩාර
9. කේ. ඒ. නයනජිත් චමින්ද
10. කේ.ඒ.සී. අනුරුද්ධ

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 233

---

මගේ අංකය: IR/COM/02/2019/226.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. කේ. පී. මහින්ද මයා, අංක 197, ලුකස්ගොඩ, තිස්සමහාරාම

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213, එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2019/226.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. කේ. පී. මහින්ද මයා, අංක 197, ලූකස්ගොඩ, තිස්සමහාරාම

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (පෙර සී/ස රුහුණු බස් සමාගම, ගාල්ල) සේවක ඒ. කේ. පී. මහින්ද මහතාට,

1. රු. 200/- ක මුදලක් වංචා කළ බවට චෝදනා කර සේවය තහනම් කිරීම හා ලබා දී ඇති දඬුවම.

2. අනුමැතියකින් තොරව උසස්වීම් ලිපි ලබා දී ඒ අනුව වැටුප් ගෙවා ඇති බවට චෝදනා කිරීම හා ලබා දී ඇති දඬුවම.

3. 2004/07/01 දින සිට තනතුරු නාමය වෙනස්කර සේවයේ යෙදවීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.